සාමාන්‍ය සමය සයවන ඉරුදින **දේව ප්‍රකාශන** 12-02-12

## පළමුවන කියැවීම

ලෙවී කථාව 13:1-2, 44-46

ලෙවී ව්‍යවස්ථාවෙන්ගත් පාඨයකි.

**"ලාදුරු රෝගියා කඳවුරෙන් පිට වී හුදෙකලාව විසිය යුතු ය."**

තවද සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා ආරොන්ට කතා කොට මෙසේ වදාළ සේක. "යමෙකුගේ ශරීරයේ හමේ බිබිලක් හෝ තඩිස්සියක් හෝ පැල්ලමක් හට ගෙන, එය බෝ වන චර්ම රෝගයක් වන්නට ඉඩ තිබේ නම්, ඔහු පූජක ආරොන් වෙත හෝ පූජකයකු වන ඔහුගේ පුතකු වෙත හෝ ගෙනා යුතු ය. ඔහු හමේ බෝවන රෝගයක් ඇති කෙනෙකු නම් ඔහු අපවිත්‍ර ය. පූජකවරයා ඒ තැනැත්තාගේ හිසේ බෝවන චර්ම රෝගයක් ඇති බැවින් ඔහු අපවිත්‍ර යයි ප්‍රකාශ කළ යුතු ය. බෝවන චර්ම රෝගියා ද තම වස්ත්‍රය ඉරාගෙන, තමන්ගේ හිසකෙස් අවුල් කොට ගෙන තම උඩු තොල දක්වා වත්ත්‍ර පටියකින් වසා ගෙන, 'අපවිත්‍රය, අපවිත්‍රය,' යි කෑ ගැසිය යුතු ය. බෝවන චර්ම රෝගය ඇති මුළු කාලය තුළ ම ඔහු කෙළෙසුණු, අපවිත්‍ර කෙනෙකි. ඔහු කඳවුරෙන් පිටත හුදකලාව විසිය යුතු ය."

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 32:1,2,5,11

පිළිතුර: සමිඳුනී, මා රැකවරණය ඔබ වහන්සේ ම ය.

ගීය: අපරාධයට සමාව ද පාපයට සමාව ද ලත් මිනිසා ආසිරි ලද්දෙකි.
වරදක් ගැන සමිඳුන්ගෙන් චෝදනාවක් නොලබන, වංක සිතක් නොමැති
මිනිසා ආසිරි ලද්දෙකි.

මාගේ පව් නොසඟවා මම පාපොච්චාරණය කළෙමි. 'හිමි තුමන්ට මාගේ
පව් කියන්නෙමි' යි කීමි. ඔබ ද මාගේ පාප දෝෂ කමා කළ සේක.

දැමිටුනි, හිමි තුමන් කෙරේ ප්‍රීති වී උදන් අනන්න. අවංක සිත් ඇති
සියල්ලෙනි, ප්‍රීති ඝෝෂා පවත්වන්න.

## දෙවන කියැවීම

1කොරින්ති 10:31-11:1

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් කොරින්තවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**"මා ක්‍රිස්තුස් වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් ඔබ ද මා ආදර්ශයට ගන්න."**

"මා ක්‍රිස්තුස් වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් ඔබ ද මා ආදර්ශයට ගන්න." එහෙයින් ඔබ කෑවත් බීවත් වෙන දෙයක් කළත් සියල්ල දේව ගෞරවය පිණිස කරන්න. ජුදෙව්වරුන්ට වත්, ග්‍රීකයන්ට වත්, දෙවියන් වහන්සේගේ සභාවට වත් බාධාවට හේතුවක් නොවන්න. මම නම් මාගේ ම ප්‍රයෝජනය නොසොයා බොහෝ දෙනෙකුගේ ගැළවීම පිණිස ඔවුන්ගේ ප්‍රයෝජනය සොයා, සියල්ලෙහි දී සියල්ලන් සතුටු කරමි. මා ක්‍රිස්තුස් වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් ඔබ ද මා ආදර්ශයට ගන්න.

දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

ජුවාම් 6:51

ආලේලූයා! ආලේලූයා!

"ස්වර්ගයෙන් පහළවන ජීවන දායක භෝජනය මම ය. යමෙක් මේ භෝජනයෙන් වැළඳුවොත්, ඔහු සදතල් ජීවත් වන්නේ ය." යි ස්වාමින් වහන්සේ වදාරණ සේක. ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 1:40 45

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**එකෙණෙහි ම ලාදුරු රෝගය සුව වී ඔහු පවිත්‍ර කරනු ලැබුවේ ය.**

එකල, ලාදුරු රෝගියෙක් ජේසුස් වහන්සේ වෙත අවුත් දණින් වැටී, "ඔබ කැමැති සේක් නම්, මා පවිත්‍ර කරන්න ඔබට හැකි ය"යි අයැද සිටියේ ය. උන් වහන්සේ මහානුකම්පාවෙන් අත දිගු කොට ඔහු පිට තබා, "මම කැමැත්තෙමි, පවිත්‍ර වන්නැ"යි වදාළ සේක. එකෙණෙහි ම ලාදුරු රෝගය පහ වී ඔහු පවිත්‍ර කරනු ලැබී ය. උන් වහන්සේ, "මේ ගැන කිසිවෙකුට කිසිවක් නොකියන ලෙස බලාගන්නැ"යි ඔහුට තදින් අණ දී, "යන්න, පූජකයා ඉදිරියෙහි පෙනී සිටින්න; මෝසෙස්ගේ නියමය පරිදි පවිත්‍රවීමේ සහතිකයක් ලෙස පූජා ඔප්පු කරන්න" කියා ඔහු වහා පිටත් කර යැවූ සේක. එහෙත්, ඔහු ගොස් ඒ මුළු සිද්ධිය ප්‍රසිද්ධ ලෙස කිය කියා, දස දෙස පතුරුවා හැරියේ ය. එහෙයින්, කිසි නුවරකට ප්‍රසිද්ධියේ පිවිසෙන්නට ඉන්පසු උන් වහන්සේට නොහැකි වූයෙන්, ජේසුස් වහන්සේ පාළු පෙදෙස්වල නැවතුණ සේක. එසේ වුව ද, සමූහයා සියලු දිශා භාගවලින් උන් වහන්සේ වෙත පැමිණියහ.

සුවිශේෂ වාක්‍යය එසේ ය.